**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූලි 29 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 20 ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරනු කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) **පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීමක් සඳහා දරන ලද රු.686,138ක් මූලධන වැය විෂය අංක 270-1-1-0-2001 යටතේ නොදක්වා පුනරාවර්තන වැය විෂය අංක 270-1-1-0-1303 යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් ගොඩනැගිලි අළුත්වැඩියා වියදම එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. | පුනරාවර්තන වැය ශීර්ෂය යටතේ මේ සඳහා ප්‍රතිපාදන සැලසීම නිසා මෙලෙස ගිණුම්ගත කර ඇත. | අළුතින් ඉදිකරන ලද මෙම කාර්යය සඳහා දරන ලද පිරිවැය මූලධන වැය විෂයය යටතේ දැක්විය යුතුය. |

(ආ) **මූලධන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දමන, අක්කරෙයිපත්තු සහ නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම රු.73,662,621කින් අඩුවෙන්ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ආලෙයිඅඩිවේම්බු, ඉරක්කාමම් සහ නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම රු.181,052,927කින් වැඩියෙනුත් සඳහන් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.107,390,306කින් අධි ගණනය වී තිබුණි. | අදාල වටිනාකම් ඉදිරි වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම්වල නිවැරදි තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඉඩම්වල තක්සේරු වටිනාකම රු.13,900,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.13,900,000කින් ඌන ගණනය වී තිබුණි. | -එම- | -එම- |

(ඇ) **අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව, සේවය අත්හිටවූ, සේවය අත්හැරගිය, මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 08ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් මාස 03 සිට වර්ෂ 03ක කාල පරාසයක සිට හිඟහිටිව පැවැති රු.1,546,553ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා තිබූ නමුත් ඒ සඳහා අනුමැතිය මේ දක්වා නොලැබීම හේතුවෙන් නිරවුල් නොකරන ලදි. | හිඟහිටිව පවතින ශේෂ ප්‍රමාදයකින් තොරව අයකළ යුතුය. |

(ඈ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව යාවත්කාලීන කර නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | **හානි හා පාඩු පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් යාවත්කාලිනව පවත්වා නොතිබුණි. | ඉදිරියේදි අදාල ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ii)** | **බැරකම් පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලිනව පවත්වා නොතිබුණි. | -එම- | -එම- |
| **(iii)** | **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | -එම- |
| **(iv)** | **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් සහ සේවකයන්ගේ විස්තර ඇතුළත් ඇප ලේඛනයක් යාවත්කාලිනව පවත්වා නොතිබුණි. | -එම- | -එම- |

**(ඉ) ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු උවත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**(ඊ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම**<br>රු. | **අනුකූල නොවීම** | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5 සහ 5:1 වගන්ති | 355,782 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 16ක පදිංචිව සිටින පදිංචිකරුවන්ගෙන් හිඟකුලී අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මේ පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හිඟහිටිව පැවැති වටිනාකම පිළිබඳව පිළිතුරු ලබාදීමට නොහැකි වී තිබුණි. | හිඟකුලී අයකිරීමට පියවර ගත යුතු ය. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 261 (3) | 4>869>983 | ප්‍රමාණවත් මුදල් නොමැති විටෙකදී මුදල් පොතෙන් ගෙවීම් සිදු නොකළ යුතු අතර ගෙවීම් සඳහා චෙක්පත් නොලිවිය යුතු බවට සඳහන් වුවත්, සායින්ද මරුදූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් චෙක්පත් 08ක් ලියා තිබු | සායින්ද මරුදූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඔබ විසින් අනාවරණය කර තිබු චෙක්පත්වලින් රු.2,156,263ක් වටිනා චෙක්පත් නිකුත් කර තිබුණි. | රජයේ ආදායමට මාරුකිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නමුත් මෙම චෙක්පත් 2022 අප්‍රේල් 05 දින වන විටත් නිකුත් කර නොතිබුණි. | | |
| (iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය – 2006 සහ විශේෂ ඇමුණුම් - 35 | 5,877,000 | ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (RPC) භාණ්ඩ හා සේවා සඳහා ප්‍රසම්පාදන සීමාව රු. මිලියන 1ක් වුවද, එම සීමාව ඉක්මවා රු. 2,175,000ක් වටිනාකමට උඳු පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් (Black Gram Skin Removing Machine), තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්ද රු.3,702,000ක් වටිනා දුමෙන් වියලිමේ යන්ත්‍රයක් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්ද මිලදී ගෙන තිබුණි. | මෙම පිළිවෙත දෝෂසහගත බවත් ඉදිරියේදී මෙලෙස ක්‍රියා නොකරන ලෙසට ප්‍රාදේශීය ලේකම්වරයාට උපදෙස් ලබාදී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යන්ට අනුගතව කටයුතු කළයුතු ය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **අග්‍රිම කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා රු.648,748,967ක අග්‍රිම ඉල්ලුම් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.453,936,880ක අග්‍රිම පමණක් ලැබී තිබුණි. ඒ අනුව, ඉල්ලුම් කළ අග්‍රිම වටිනාකමින් රු.194,812,087ක් නොලැබීම හේතුවෙන් වර්ෂය තුළ සැලසුම් කළ ව්‍යාපෘති නියමිත කාලය තුළ අවසන් කිරීමට නොහැකිවී තිබුණි. | අග්‍රිම ඉල්ලුම් පත්‍ර භාණ්ඩාගාරය වෙත යවා ඇත. | අග්‍රිම නිසි කළමනාකරණයක් සිදුකර නියමිත කාලය තුළ ලබාගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2.2** **වියදම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 100ක් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වැය විෂය අංක 270-1-1-7-2509 යටතේ 2021 සැප්තැම්බර් 29 දින ලැබී තිබුණත්, මෙම ප්‍රතිපාදනය උපයෝජනය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් | කාබනික පොහොර නිෂ්පාදනය, මිලදී ගැනීම් පිළිබඳව කිසිදු යෝජනා ක්‍රමයක් හෝ මාර්ගෝපදේශයක් හෝ උපදේශයන් නොලැබීම හේතුවෙන් මෙම ප්‍රතිපාදනය උපයෝජනය කිරීමට නොහැකි | වර්ෂය තුළ වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. ඒ හේතුවෙන් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ අරමුණු ළඟාකර ගෙන නොතිබුණි. | විය. | |
| (ආ) | පුනරාවර්තන වැය විෂයන් 05ක් සඳහා සහ මූලධන වැය විෂයන් 04ක් සඳහා රු. 148,476,069ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී සලසා තිබූ නමුත් රු.72,822,446ක් පමණක් වැය කර තිබීම හේතුවෙන් රු. 75,653,624ක් ඉතිරි වී පැවැතුණි. මෙම ඉතිරිය මුළු වියදම් ප්‍රතිපාදනයෙන් සියයට 10ක සිට සියයට 58ක් දක්වා පරාසයක පැවැතුණි. මේ හේතුවෙන් මෙම වැය විෂයය මගින් අපේක්ෂා කළ අරමුණු ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. | පුනරාවර්තන වියදම් සඳහා අවශ්‍ය ප්‍රමාණය අඩුවෙන් පැවැති අතර තවදුරටත් ණය පොලී ගෙවීම සඳහා අවශ්‍යතාවයක් මතු නොවීය. මෙහි මූලධන වියදම් වශයෙන් සඳහන් කරන්නේ ගොඩනැගිලි ඉදිකිරීම වේ. මෙහි ඇති රු.මිලියන 90ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 40ක් නැවත ලබාගන්නා ලදි. | වර්ෂය තුළ වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

**2.3 වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ 37ක් සහ දෙපාර්තමේන්තු 23කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 5,275ක ප්‍රතිපාදන ලැබී තිබුණි. මෙම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු. මිලියන 3,531ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව රු. මිලියන 1,745ක් ඉතිරි වී පැවැතුණි. මේ හේතුවෙන් අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අපේක්ෂා කළ ව්‍යාපෘති නියමිත පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. | අමාත්‍යාංශ 37ක ප්‍රතිපාදන ඉතිරිවීම් රු.1,673,683,424ක් සහ දෙපාර්තමේන්තු 23ක් සඳහා ප්‍රතිපාදන ඉතිරිවීම් රු. 69,336,228ක් විය. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් වෙන්කළ ප්‍රතිපාදන ඵලදායි ආකාරයෙන් උපයෝජනය කළ යුතුය. |

**2.4 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම්වරයා වෙනුවෙන් රජයේ නිවාසයක් තිබියදී, එම නිවසේ පදිංචි වීමට කටයුතු නොකර කුලී නිවාසයක පදිංචිවීම හේතුවෙන් රු.324,000ක් වැය කිරීමට සිදුවී තිබුණි. | අපගේ ලේකම් කාර්යාල ඉංජිනේරුවරයා විසින් භෞතිකව පරීක්ෂා කළ අවස්ථාවේදී මෙම නිවාසය අළුත්වැඩියා කිරීමට විශාල වියදමක් දැරීමට සිදුවන බවට ඔහු විසින් වාචිකව දන්වා තිබුණි. | ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිල නිවාසය අළුත්වැඩියා කර කුලී වියදම අවම කරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නින්දවූර් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ග්‍රාමසේවා වසම් දෙකක සෞභාග්‍යා වැඩසටහන යටතේ රු.600,000ක් වටිනා කුකුල් පැටව් 1800ක් ප්‍රතිලාභීන් 60කට ලබාදී තිබුණත්, සියයට 24ක් හෙවත් රු.282,000ක් වටිනා කුකුල් පැටව් 430ක් මාස 03ක් ඇතුළත මියයාම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට ලබාගත නොහැකි වී තිබුණි. | කුකුල් පැටව් පළමු අදියර වශයෙන් ලබාදුන් කාල පරිච්ඡේදයේදි පැවැති වැසිසහිත කාලගුණය හේතුවෙන් කුකුල් පැටව් මිය ගොස් තිබුණි. | ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට ඒ පිළිබඳ පසුවිපරම් කටයුතු නිලධාරීන් විසින් සිදුකළ යුතුය. |

### 3.1.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැගෙනහිර පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, පශුසම්පත් නිෂ්පාදන, සංවර්ධන, ධීවර සමූපකාර සංවර්ධන සහ ආහාර සැපයීම සහ බෙදාහැරීමේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා රු.200,000ක් කල්මුණේ සහ දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සමාලෝචිත වර්ෂයේ ලබාදී තිබූ නමුත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදි ව්‍යාපෘතිය ආරම්භ කර ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරන බව ප්‍රාදේශීය ලේකම් වරයා දන්වා ඇත. | ව්‍යාපෘති ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංශෝධිත විමධ්‍යගත අයවැය යටතේ ව්‍යාපෘති 04ක් සඳහා වෙන්කළ රු.500,000ක් වටිනා කාර්යයන් කොන්ත්‍රාත්කරු නියමිත කාලයේදි ආරම්භ නොකිරීම නිසා මෙම ව්‍යාපෘති අත්හැර දමා තිබුණි.මෙහි ප්‍රතිපලයක් වශයෙන් නියමිත ව්‍යාපෘතියේ ප්‍රතිලාභ මහජනතාවට ලැබී නොතිබුණි. | අදාල කෘෂි සංවිධානය අසාධු ලේඛනයට ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත. | ව්‍යාපෘති කටයුතු විධිමත්ව අධීක්ෂණය කර නියමිත කාල රාමුව තුළ ඉටුකළ යුතුය. |

**3.1.3 ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා වැඩසටහන යටතේ කහ නිෂ්පාදන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.1,779,771ක් වැය කර තිබුණි. මෙම කාර්යය 2021 දෙසැම්බර් 31 දින වන විට අවසන් විය යුතු බව ගිවිසුමේ සඳහන් වුවත්, මෙම ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය 2022 මැයි 09 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | ඉදිකිරීම් කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවේදි රටෙහි පැවැති වෛරස් ආසාදන තත්ත්වය මෙම තත්ත්වයට බලපා තිබුණි. | ව්‍යාපෘති කටයුතු නියමිත කාල රාමුව තුළ ඉටුකළ යුතුය. |
| (ආ) | උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් “ගම සමග පිළිසඳර” වැඩසටහන යටතේ රජයේ සේවාවන් එකම ස්ථානයකින් ඉටුකරවා ගැනීමට අදාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.3,326,585ක් කොන්ත්‍රාත් කරුවෙකුට ලබාදී තිබූ නමුත් මෙම කාර්යය 2022 මැයි 09 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුගොල්ල ගම්මානයේ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මසුන් අභිජනන ජල තටාක 30ක් ඉදිකිරීම සඳහා රු.2,667,600ක් සමාලෝචිත වර්ෂයේ ලබාදී තිබුණු අතර, මෙම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දින අවසන් විය යුතු වුවත්, මසුන් අභිජනන ජල තටාක 17ක් 2022 මැයි මස වන විටත් ඉදිකර නොතිබුණි. | ඉතාමත් ඉක්මනින් මසුන් අභිජනනය ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

**3.1.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තිරුක්කෝවිල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට සෞභාග්‍යා වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ ලබාදුන් රු.2,175,000ක් උඳු පොතු ඉවත් කිරීමේ යන්ත්‍ර (Black Gram Removing Machine) 2021 දෙසැම්බර් 31 දින මිලදීගෙන තිබුණත් අදාල යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රමාණවත් දැනුවත් වීමක් සංගමයේ | අදාල යන්ත්‍ර ස්ථාපිත කිරීමෙන් පසුව ඉහත ක්‍රියාකාරකම් සියල්ල නියමිත පරිදි සිදුකරනු ලැබේ. | වත්කම් ඵලදායිව උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සාමාජිකයන් සතුව නොතිබීම හේතුවෙන් 2022 මැයි වන විටත් මෙම යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | | |
| (ආ) | සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ආලෙයියඩිවේම්බු සහ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිෂ්පාදන ගම්මාන ස්ථාපිත කර ජනතාවගේ ජීවනෝපාය නැංවීම සඳහා වූ වැඩසටහන යටතේ එළුවන් මිලදී ගැනීම, පට්ටි ඉදිකිරීම්, රක්ෂණ සහ පුහුණුව ලබාදීම සඳහා එකතුව රු.11,955,340ක් මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබුණි. එනමුත්, එළුවන් මියයාම වෙනුවෙන් රක්ෂණය සිදුනොකිරීම නිසා ප්‍රතිලාභීන්ට ලබාදුන් එකතුව රු.580,800ක් වටිනා එළුවන් 294කින් 46ක් මාස 03ක් ඇතුළත මියගොස් තිබුණත් මෙම එළුවන් වෙනුවෙන් වන්දි ලබාගත නොහැකිවීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. | කඩිනමින් රක්ෂණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ව්‍යාපෘති ඵලදායීව ඉටුකළ යුතුය. |

**3.1.5 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රධාන මාර්ගයේ මංසන්ධිවල වීථි ලාම්පු සවිකිරීම සඳහා රු. මිලියන 05ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. නමුත්, අනුමත කළ ගිවිසුම් ප්‍රකාරව, රු.4,540,900ක් වටිනා කාර්යයන් 2021 සැප්තැම්බර් 24 දින ආරම්භ කර 2021 නොවැම්බර් 23 දින අවසන් කළ යුතුව තිබුණත්, මෙම කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | රටෙහි පැවැති කොවිඩ් - 19 වසංගතය සහ වීථි ලාම්පු කණු කුමන ස්ථානවල ස්ථාපිත කරනු ලබන්නේද? යන්න ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ඉරක්කාමම් මහජනතාව අතර ප්‍රතිවිරුද්ධ අදහස් පැවතුණි. | ව්‍යාපෘති කාලීනව ඉටුකළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් වර්ෂ 21කට අධික කාලයක සිට අළුත්වැඩියා සිදුකිරීම සඳහා ගරාජයකට භාරදී තිබුණත්, එය අළුත්වැඩියා කිරීමට හෝ ආපසු ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි. | එම ස්ථානයේදීම වාහනය වෙන්දේසියේ විකිණීමට කටයුතු කළයුතු බවට තිරණය කරන ලදි. | වාහනය අළුත්වැඩියා කටයුතු කඩිනමින් ඉටුකර ඵලදායීව ධාවනයට යොදාගත යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2022 මැයි මාසය දක්වා යතුරු පැදි 43ක් ධාවනයට යොදා නොගැනීම හේතුවෙන් වර්ෂ 3කට අධික කාලයක සිට ගබඩා සංකීර්ණයේ නවතා තබා තිබුණි. | කාර්යාල නිලධාරීන් විසින් ඉල්ලුම් කිරිමේ ලිපි ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | යතුරුපැදි ඵලදායීව ධාවනයට යොදාගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දෙහිඅත්තකණ්ඩිය, පදියතලාව, මහඔය, දමන, අඩ්ඩාලච්චේන සහ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම්වල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | හිමිකාරිත්වය ලබාගැනීමෙන් පසුව තක්සේරු කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් ලබාදී ඇත. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු ඉඩම්වල හිමිකාරිත්වය ලබාගෙන එම ඉඩම්වල වටිනාකම තක්සේරු කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සන්දාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් කඩා සිදුවූ පාඩුව රු.850,738ක් ලෙස තක්සේරු කර තිබුණත්, 2022 මැයි 19 දින වන විටත් ඉදිරි පියවර ගෙන නොතිබුණි. | ඉතා ඉක්මනින් එම කාර්යය ඉටුකිරීමට කටයුතු කිරීමට නියමිතය. | මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දීර්සකාලීන බදු පදනමින් ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් කල්මුනේ සහ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයකළ යුතු හිඟබදු එකතුව රු.2,863,604 ක් අයකර ගැනීමට පසුගිය වර්ෂ 03ක කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | මෙවැනි ගැටළු හේතුවෙන් දීර්සකාලීන හිඟබදු වටිනාකම අයකිරීමේදි බාධාවන් සිදුවී ඇති බවට ඔබ වෙත දන්වමි. | දීර්සකාලීන හිඟබදු කුලි කඩිනමින් අයකිරිමට කටයුතු කළයුතුය. |
| (ආ) | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සාඉන්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 2.91ක වියදමින් අත්යන්ත්‍ර භාණ්ඩ විකිණීමේ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණත් 2022 මැයි මස වන විටත් මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. | අත්යන්ත්‍ර නිෂ්පාදනයන් සිදුකර නිෂ්පාදිත ඇඳුම් අදාල මධ්‍යස්ථානයේ තබා විකිණිමට කටයුතු කරනු ලැබේ. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වටිනාගල මාර්ගයේ එක් කොටසක කිලෝමීටර් 22ක දුර අලි වැට ඉදිකිරීම සඳහා මාර්ගය එළිපෙහෙලි කිරීමේ කාර්යයට වනජීවී දෙපාර්තමේන්තුව රු.1,783,066ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ සලසා තිබුණි. මෙම කාර්යයෙන් කිලෝමීටර 15ක දුරක වැඩ සඳහා රු.1,315,645ක් කොන්ත්‍රාත්කරුට 2021 අගෝස්තු 24 දින ගෙවීම් සිදුකර තිබුණද ඉන් වැඩ ඉටුනොකළ කිලෝමීටර 06ක දුර සඳහා රු.526,259ක් ගෙවීම් කර තිබුණි. | මැනීම් කටයුතු සිදුකර නිවැරදි වාර්තා ඔබ වෙත යැවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකරගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 2380ක් ද, තථ්‍ය කාර්ය මණ්ඩලය 2268ක් වශයෙන් පැවැතුණ අතර කාර්ය මණ්ඩලයේ පැවැති පුරප්පාඩු 234ක් පිරවීමටත් අතිරික්ත 122ක් විධිමත්ව අනුමත කරවා ගැනීමටත් පියවර ගෙන නොතිබුණි. | අදාල පුරප්පාඩුව පවතින සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිංහල භාෂාවෙන් රාජකාරි ඉටුකරන නිලධාරීන්ට අදාල පුරප්පාඩු අඛණ්ඩව පවතී. | ඵලාදයීව මහජන සේවාවන් සැලැසීමට පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුරප්පාඩුව පවතින ග්‍රාම නිලධාරී තනතුරු 78ක් සඳහා ස්ථිර නිලධාරීන් බඳවා නොගැනීම නිසා ග්‍රාම නිලධාරී වසම්වල පරිපාලන කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි. | ග්‍රාම නිලධාරීන් අනුයුක්ත කර ගැනීම සිදුකරනු ලබන්නේ ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය වේ. | රාජකාරි අවශ්‍යතා සැලකිල්ලට ගෙන සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව, උපරිම සේවා කාලය සෑම සේවා ස්ථානයකම වර්ෂ 05ක් සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ සැලැසීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු බව සඳහන් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 51ක් වර්ෂ 06 සිට 31ක් දක්වා කාලයක් එකම සේවා ස්ථානයක නියුතුව සිටියත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වෙනත් සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් එම නිලධාරීන්ට ස්ථාන මාරුවීම් ලබාදී නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |